# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No – 10120

ෆැක්ස් / தொலைநகல / Fax – 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone – 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site – www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail – dir.media@police.gov.lk


---

මගේ අංකය / எனது இலக்கம் / My NO – 404/2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No – / 2024

දිනය / திக / Date – 08/03/2024 පැය 0845

**මාධ්‍ය නිවේදනය**

**පොලිස් අත්අඩංගුවට පත් සැකකරුවෙකු රෝහල් ගත කිරීමෙන් පසු මියයාම සම්බන්ධව - මාදම්පේ පොලිස් ස්ථානය.**

2024.03.06 වන දින මාදම්පේ පොලිස් වසමේ පම්බල ප්‍රදේශයේදී හලාවත කොට්ඨාස විෂ මත්ද්‍රව්‍ය ඒකකයේ නිලධාරින් කණ්ඩායමක් විසින් ලද තොරතුරකට අනුව මත්ද්‍රව්‍ය වැටලීමක් සිදුකර ඇති අතර, එහිදි සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට ගැනීමට යාමේදී පලා ගොස් ඇත. නිලධාරීන් විසින් ඔවුන් පසු පස ලුහු බැඳ යාමේදී එක් සැකකරුවෙකු බිම ඇද වැටී ඇති අතර, පසුව නිලධාරීන් විසින් සැකකරුවන් දෙදෙනාම අත්අඩංගුවට ගෙන ඇත.

බිම ඇද වැටී සිටි සැකකරු සිහිසුන් වීම හේතුවෙන් නිලධාරින් විසින් එම පුද්ගලයා කඩිනමින් හලාවත රෝහලට ඇතුලත් කර ඇති අතර, සැකකරු පරීක්ෂා කළ වෛද්‍යවරුන් විසින් ඔහු මියගොස් ඇති බවට දන්වා ඇත. මරණකරු වයස අවුරුදු 37 ක් වූ හලාවත ප්‍රදේශයේ පදිංචි කරුවෙකු වේ.

අනෙක් සැකකරු සන්තකයේ හෙරොයින් මිලිග්‍රෑම් 720 ක් තිබී ඇති අතර, ඔහු 2024.03.07 වන දින හලාවත ගරු මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කර රුපියල් 10,000/- ක දඩයකට යටත්ව මුදා හැර ඇත. සැකකරුවන් අත්අඩංගුවට ගැනීමට යාමේදී තුවාල ලැබූ පොලිස් සැරයන්වරයෙකුද හලාවත රෝහල වෙත ඇතුලත් කර ඇත.

මරකණකරු සන්තකයේ තිබී හෙරොයින් පාර්සලයක් සහ ලයිටරයක් වෛද්‍යරයා විසින් භාරයට ගෙන ඇත. සිද්ධිය සම්බන්ධව හලාවත ගරු මහේස්ත්‍රාත් තුමා විසින් මහේස්ත්‍රාත් පරික්ෂණය සිදු කිරීමෙන් පසු පශ්චාත් මරණ පරීක්ෂණය 2024.03.07 වන දින හලාවත රෝහලේ දී සිදුකරන ලදී.

එහිදී, මත්ද්‍රව්‍ය අඩංගු පොලිතින් කවර කැබැල්ලක් ස්වරාලයේ හිරවීම හේතුවෙන් හුස්ම ගැනීමට නොහැකි වීමෙන් සිදුවූ මරණයක් බවට හලාවත රෝහලේ විශේෂඥ අධිකරණ වෛද්‍ය නිලධාරියා විසින් පශ්චාත් මරණ පරික්ෂණ වාර්තාව නිකුත් කර ඇත. මරණකරුගේ මුත්‍රා පරීක්ෂණයේදී මියයාමට පෙර අයිස් මත්ද්‍රව්‍ය භාවිතා කර ඇති බවටද වාර්තාවේ සඳහන් කර ඇත.

මාදම්පේ පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරගෙන යනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**